# කඳුකරය හැඩකරන සුන්දර සානුව හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානය

"අවට සියළුම දේ මීදුමෙන් වැසීගොස් ඇත. සියොළඟම දැනෙනුයේ දරාගත නොහැකි තරමේ සීතලකි. කුරු එහෙත් හොඳින් වැඩුණු වෘක්ෂයෝ නොසෙල්වී සිට අඳුරු සෙවණැලි මවති. තැන තැන විසිරී ඇති හුදකලා වනාන්තර හැරුණු විට නෙතට පෙනෙන මානයේ දිස්වනුයේ තෘණ භූමියක දර්ශනයකි."

ඉහත ජේදය කියවන ඔබට නිතැතින්ම කඳුකරයේ ඇති, අප පුංචි ලංකාවට අති මහත් සම්පතක් වූ සුන්දර පරිසරයක් පිළිබඳ මතකය මනසට නැගෙනු නොඅනුමානය. ඒ අන් කිසිවක් නොව සොබා දහමේ විස්මිත නිර්මාණයක් වන සුන්දර හෝර්ටන්තැන්නය.

හෝර්ටන් තැන්නේ සුන්දරත්වය හුවා දැක්වීමට උත්සාහ ගත්තද, එහි ජෛවීය, ජලජ, ඓතිහාසික, දේශගුණික හා සමාජීය වැදගත්කම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය. ඒ හුදෙක් සුන්දරත්වයට වඩා වැඩි යමක් ඇතැයි යන්න අප හට අවබෝධ වන නිසාය.

## හෝර්ටන් තැන්නේ ඉතිහාසය.

මෙම පරිසරය පිළිබඳ කරුණු ගොනු කිරීමේදී ඓතිහාසික තොරතුරු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙහිදී අප දන්නා කියන ඉතිහාසයෙන් බොහෝ ඈතට හෝර්ටන් තැන්නේ සමහර සිද්ධි ගමන් කරයි. රාවණා රජු ඉන්දියාවේ සිට සීතා කුමරිය පැහැරගෙන විත් සඳ තැන්නේ, සීතා එළිය ප්‍රදේශයට ගෙන යාමට පෙරාතුව හෝර්ටන් තැන්නේ බටහිර මායිමේ ඇති අග්‍රා බෝපත් කඳුවැටියේ වූ ගල් ලෙනක සඟවා තැබූ බවට පුරා වෘත්ත ඇත. අද ද අග්‍රා බෝපත්හි ඇති සමහර ගල් ලෙන්හි කටාරම් කොටා ඇති අයුරු දැක ගත හැකිය..

කෙසේ නමුදු හෝර්ටන් තැන්න නිල වශයෙන් සොයා ගැනීමේ ගෞරවය කපිතාන් විලියම් ෆිෂර් හා කර්නල් ඇල්බට් වොට්සන් හට හිමිවේ. එවකට, එනම් 1933 දී ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ සර් රොබට් හෝර්ටන් හට ගරු කිරීමක් වශයෙන් මෙයට හෝර්ටන් තැන්න යන නම තබා ඇත. නමුත් අතීතයේ සිංහලයන් මෙම ප්‍රදේශයට මහ එළිය (Great plains), මැණික් පොකුණු ආදී නම් භාවිතා කර ඇත. එමෙන්ම රොබට් හෝර්ටන්ගේ නුවර එළිය සංචාරයේදී, නුවර එළිය හා රත්නපුර අතර ඇති මහ එළිය නම් ස්ථානයේදී සබරගමු පළාතේ රටේ මහත්තයා හමුවී සාකච්ඡා කළ බවට පොතපතේ සඳහන් වේ.

කෙසේ නමුදු පසුව සමහර ඉංග්‍රීසි ජාතික වැවිලි කරුවන්ගේ දඩයම් බිමක් බවට මෙම තැන්න යොදා ගෙන ඇත. ගෝනුන් හා අලින් දඩයම ඒ අතුරින් ප්‍රමුඛ වී ඇත. ජේම්ස් ඇන්ඩසන් හා තෝමස් ෆාර් ඒ අතුරින් වඩාත් ප්‍රසිද්ධියක් උසුලයි. 1900 පමණ ඔවුන් විසින් ඇන්ඩසන් ලොජ් හා ෆාර් ඉන් (far in) ලෙස වර්තමානයේ ව්‍යවහාර කරනු ලබන නිවාඩු නිකේතන දෙක ඉදිකර ඇත.

තවද 1950 දී පමණ එවක ආණ්ඩුව සිවින් අඩි 5000කට වඩා උස්බිම් වල ගස් කැපීම තහනම් කිරීම ද අද දක්වා හෝර්ටන් තැන්න සුරැකී පැවතීමට හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය.

ඉහත ආකාරයට හෝර්ටන් තැන්නේ අප දන්නා ඉතිහාසය පෙන්වා දිය හැකිය. එහෙත් මෑතක සිදුකළ හා දැනට ද සිදු කරමින් පවතින පුරා පාරිසරික විද්‍යා පර්යේෂණ මගින් මෙහි බොහෝ ඈත ඉතිහාසය පිළිබඳ තතු ගෙනහැර දක්වයි. ඒ අනුව එළඹි නිගමනයන්හි සාරාංශගත කිරීම පහත පරිදි වේ.

*අදින් වසර 1000කට පෙර පතනශීලී වනාන්තර හා ජලජ පාරිසරික තත්ත්වයන් පැවත ඇත.

*අදින් වසර 2000 කට පෙර හෝර්ටන් තැන්න කඳුකර වනාන්තර වලින් වැසී තිබී ඇත.

*අදින් වසර 3000 කට පෙර හෝර්ටන් තැන්න සැවානා වනාන්තර හා කඳුකර වනාන්තර වලින් වැසී තිබී ඇත.

*අදින් වසර 4000 කට පෙර හෝර්ටන් තැන්න බාර්ලි හා වී වගාවට යොදාගෙන ඇති අතර තෘණ උලාකන සතුන්ගේ දැඩි ග්‍රහනයකට නතුවී ඇත. තව ද නිම්න පතල්වල වගුරු බිම් අධිකව තිබී ඇති අතර සමස්තයක් වශයෙන් වියළි දේශගුණික තත්ත්ව පැවත ඇත.

*අදින් වසර 6500 කට පෙර හෝර්ටන් තැන්න සැවානා වනාන්තර තෘණ භූමි බහුලවී ඇති අතර තැනින් තැන විසිරුණු ඉතා කුඩා වගුරුබිම් හා ශුෂ්ක, අර්ධ ශුෂ්ක ලක්ෂණ පෙන්වා ඇත.

කෙසේ නමුදු මෙම කරුණු අනුව ප්‍රාග් මානවයන්, හෝර්ටන් තැන්නේ වාසය කර ඇති බවද ,ඔප්පුවේ. මේ සඳහා සාක්ෂි ලෙස තැන්නේ තැනින් තැන හමුවන ක්ෂුද්‍ර ගල් මෙවලම් පෙන්වාදිය හැකි අතර, 1996 දී තැන්නෙන් සොයාගත් ශාක පවුලේ (බාර්ලි යැයි අනුමාන කරයි). පරාග හමුවීමද වැදගත් සාක්ෂියක් වී ඇත.

මේ අනුව හෝර්ටන් තැන්නේ අප දන්නා ඉතිහාසයට වඩා නොදන්නා ඉතිහාසය ගැඹුරු යැයි කෙනකුට සිතෙනු ඇත.

## හෝර්ටන්හි වර්තමාන තත්ත්වය.

වර්තමානයේ හෝර්ටන් තැන්න වනජීවී ආරක්ෂික ප්‍රදේශයකි. එනම් තැන්නේ ඇති සුවිශේෂත්වය සලකා 1969 දෙසැම්බර් 15 වන දින ස්වභාව රක්ෂිතයක් (Nature reserve) වශයෙන් ප්‍රකාශයට පත්කළ අතර තවදුරටත් මෙහි ජෛවීය පාරිසරික වැදගත්කම සැලකිල්ලට ගෙන 1988 මාර්තු 18 වන දින ජාතික වනෝද්‍යානයක් වශයෙන් (National Park) වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් හෙක්ටයාර 3159.8 ($32km^2$) ක බිමක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙහිදී මෙම භූමිය තුළ කෙරෙන පරිපාලන කටයුතු වනජීවී ආඥා පනතට අනුකූල ව සිදුවේ.

## හෝර්ටන් තැන්නේ පිහිටීම.

මෙය උතුරු අක්ෂාංශ $6^0 45' - 6^0 50'$ හා නැගෙනහිර දේශාංශ $80^0 46' - 80^0 50'$ අතර පිහිටා ඇත. හෝර්ටන් තැන්නේ ප්‍රාදේශීය පිහිටීම සැලකූ කල උතුරු මායිම තොටුපොළ කන්ද හා පට්ටිපොළත්, දකුණු මායිම ලෝකාන්තය හා නන්පේරියල් වතු යායත්, නැගෙනහිර මායිම ඔහිය ගම්මානයත්, බටහිර මායිමෙන් ශ්‍රී පාද අභය භූමිය හා කිරිගල්පොත්ත කන්දත් පෙන්වා දිය හැකිය.

හෝර්ටන් තැන්න පරිපාලනමය වශයෙන් බදුල්ල, රත්නපුරය යන ඌව පළාත් දිස්ත්‍රික්ක දෙකටද, නුවරඑළිය යන මධ්‍යම පලාත් දිස්ත්‍රික්කයට ද අයත්ව පිහිටන අතර මුහුදු මට්ටමේ සිට මීටර 1980 ක පමණ උසකින් පිහිටා ඇත.

## හෝර්ටන්තැන්නට පිවිසීම.

මෙයට පිවිසෙන ප්‍රධානම මාර්ග දෙක නම් ඔහිය හා පට්ටිපොළ මාර්ගයන්ය. ඩයගම මාර්ගයද සමහරු යොදා ගනිති. එමෙන්ම බඹර කන්ද දියඇල්ල හරහා කළුපහන ඔස්සේද, ගලගම ඇල්ල ප්‍රදේශය හරහා ද ශ්‍රී පාද රක්ෂිතය හරහාද, කිරිවත්ත ඔස්සේ හපුතලේ සිටද තැන්නට ළඟාවිය හැකිය. තවද ඔහිය ඔස්සේ ඇති කෙටි මග ද, බෙලිහුල්ඔය ඔස්සේ නන්වේරියල් වතුයාය හරහා වැටී ඇති කෙටි ගමන් මාර්ග ද තැන්නට පිවිසීම සඳහා යොදා ගනී.

## හේර්ටන් තැන්නේ භූගෝලීය තත්ත්වය.

හෝර්ටන් තැන්න ලංකාවේ උසම සානුව වූ හෝර්ටන් පට්ටිපොල සානුවට අයත්ව පිහිටා ඇත. එමෙන්ම ලංකාවේ දෙවනියට උසම කඳු මුදුන වන කිරිගල්පොත්ත (2394m) කන්ද හා තෙවනියට උසම කන්ද වන තොටුපළ කන්ද (2359m) මෙහි පිහිටා ඇති අතර බටහිරින් අග්‍රා බෝපත් කන්ද පිහිටා ඇත. තවද තැන්නේ දකුණු මායිම ආශ්‍රිත ව මහ ලෝකාන්තය (150m) හා කුඩා ලෝකාන්තය (60m) නම් දළ බෑවුම් සහිත මොහොර දෙකක් පිහටා ඇත.

මෙහි හමුවන විචිත්න වූ දඩ පාෂාණ කොටස් වසර දහස් ගණනක දේශගුණික තත්ත්වයන්ට ලක්වෙමින් පැවති බවට සාක්ෂි දරයි. හේර්ටන් තැන්න තුළ හමුවන පස රතු කහ පොඩිසොලික් (Red-Yellow Podizolic) ගනයට අයත් වන අතර මතුපිට පස කළු පැහැ ජෛවීය ද්‍රව්‍ය වලින් සමන්විතය. නිතර ලැබෙන වර්ෂාව හා ජලය රඳා පැවතීම හේතුකොට ගෙන පස ආම්ලික ස්වභාවයක් ගනී. එමෙන්ම පස ආශ්‍රිත ව පොඩිසොලීකරණ ක්‍රියාවලිය (Podizoliration) තදින්ම සිදුවේ. හෝර්ටන් තැන්නේ හමුවන පාෂාණ වසර දශ ලක්ෂ 300 ත් 600ත් අතර උස්බිම් ශ්‍රේණියේ (Highland series) ප්‍රාග් කේම්බ්‍රිය (Pre cambrian) යුගයට අයත් ය. මෙම පාෂාණවල සුදු පැහැ පුල්ලි පැවතීම හා හුණුගල් අන්තර්ගත වීම විශේෂත්වයකි.

## හෝර්ටන් තැන්නේ දේශගුණික තත්ත්වය.

මේ ආශ්‍රිත මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 2000-3000ත් අතර වේ. ජනවාරි හා පෙබරවාරි මාස වලදී වර්ෂාපතනය සාපේක්ෂව අඩුය.

මේ ආශ්‍රිත ව මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 14.7 කි. පෙබරවාරි මාසයේදී රාත්‍රී උෂ්ණත්වය සෙල්සියස් අංශක 5 ක් වේ. පෙබරවාරි මාසයේදී තැන්න ආශ්‍රිතව අධික මීදුම ඇති අතර විවෘත තෘණ භූමි ආශ්‍රිත ව තුහින (Frost) දැකගත හැකිය.

හෝර්ටන් ආශ්‍රිතව ජුනි මාසයේදී සුළං වේගය උපරිම වන අතර එය පැයට කි.මී. 10.1 ක් වේ. අප්‍රේල් මාසයේදී අවම සුළං වේගයක් ඇති අතර එය පැයට කි.මී. 3.9 කි.

කෙස් නමුදු හෝර්ටන් තැන්න ආශ්‍රිතව මෙහොතින් මොහොත වෙනස්වන දේශගුණික තත්ත්වයන් දැකගත හැකිය. දෙසැම්බර් ජනවාරි හා පෙබරවාරි ආදී මාසවල දී තැන්නේ කාළගුණික තත්ත්වයන්හි විවිධත්වය වැඩි වෙතැයි අධ්‍යයන අනුව පෙන්වා දිය හැකිය.

## හෝර්ටන් තැන්නේ ජලවහන රටාව.

හෝර්ටන් තැන්න ලංකාවේ ඇති වඩා වැදගත්ම ගංගා පෝෂක ප්‍රදේශයයි. මෙයට ලැබෙන වර්ෂා ජලය රඳවා තබාගෙන අවශ්‍ය පරිදි බෙදා හැරීම සිදු කරන අතර ජලය උරා ගැනීම සඳහා තෘණ භූමි සහිත ප්‍රදේශ ස්පොන්ජියක් ලෙසින් ක්‍රියාකරයි.

හෝර්ටන් තැන්නෙන් ලංකාවේ ප්‍රධාන ගංගා තුන ම ආරම්භ වේ. එනම් මහවැලි , කැළණි හා වලවේ යන මහා ගංගාවන්ය. අඹේවෙල ඔයෙහි ජල පෝෂක ප්‍රදේශය ලෙස තොටුපොළ කන්දේ උතුරු ප්‍රදේශය සැළකිය හැකි අතර බෙලිහුල්ඔයේ ආරම්භය කන්දේ දකුණු ප්‍රදේශයෙන් සිදුවේ. තොටුපොල කන්ද අවටින් පටන් ගන්නා මෙම ජල දහරා මහවැලි ගඟ පෝෂණය කරයි. කිරිගල්පොත්ත

කඳු වැටියේ උතුරු ප්‍රදේශයෙන් ආග්‍රා ඔයට ජලය සැපයෙන අතර එයින් වලවේ ගඟට ජලය සපයයි. දකුණු ප්‍රදේශයෙන් ගලා බසිනා ජල දහරාවක් මගින් කැළණි ගඟ පෝෂණය කරයි.

## හෝර්ටන් තැන්නේ ශාක සන්තතිය.

හෝර්ටන් තැන්න තුළ නිවර්තන කඳුකර වනාන්තර දේශගුණයක් ඇති අතර මේ ආශ්‍රිතව ඇති වනාන්තර දර්ශය ඉහළ කඳුකර වනාන්තර හා තෘණ භූමි (Upper montain Rain Forest and Grassland) ලෙස වර්ග කර ඇති අතර, 1945 දී රොසයිරෝට අනුව මෙය තෙත් පතන තෘණ භූමි (Wet patana grassland) ලෙසද නම් කර ඇත. කෙසේ නමුදු තෘණ භූමි හා වනාන්තර සැලකිල්ලට ගෙන upper moutain rain forest and grassland ලෙස මෑතක් වන තුරුම ශාක වර්ගීකරණ කලාප අනුව විස්තර කලද, 1987 නිමල් ගුණතිලක හා ඈෂ්ටන් යන මහාචාර්යවරුන් දෙපළ මෙහි ශාක ප්‍රජාවේ සුවිශේෂත්වය සැළකිල්ලට ගෙන වෙනම වෘක්ෂලතා කලාපයක් (Forestic region) ලෙස වර්ග කර ඇත.

එමෙන්ම 1992 දී සංරක්ෂණය සඳහා පානගමු සංවිධානයේ විජේසුන්දර මහතාගේ අධ්‍යයනයට අනුව හෝර්ටන් තැන්නේ ප්‍රධාන ශාක ව්‍යාප්ති ආකාර 07 ක් පෙන්වා දී ඇත. එවා නම්,

1. ඉහළ කඳුකර වැසි වනාන්තර.
2. තෙත් පතන තණ බිම්.
3. වගුරු හා ජලජ ප්‍රදේශ වල ශාක.
4. වනාන්තර තෘණ බිම්. (Ecotane)
5. වනාන්තරයේ විවෘත බිම්.
6. තෘණ බිම් වල හානිවූ තැන්.
7. මංමාවත් දෙපස හා ගොඩනැගිලි අවට ශාක, ආදිය.

හෝර්ටන් තැන්නේ අඛණ්ඩව ව්‍යාප්ත වූ වනාන්තර අල්පය. බහුතරය වනාන්තර කුට්ටි (Forest Patches) ලෙස වේ. මෙම වනාන්තර ආශ්‍රිත ව ඇති ශාක පිළිබඳව 1980 දී මහාචාර්ය එස්. බාලසුබ්‍රමනියම් හා එස්. රත්නායක යන දෙපළ සවිස්තරාත්මක අධ්‍යයනයක් කර ඇත. ඒ අනුව මෙහි ශාක විශේෂ 57 ක් සොයා ගෙන ඇති අතර එවා ගණ 44 කට හා කුළ 31 කට අයත් වේ. හමුවී ඇති ශාක විශේෂ 57 න් 29 ක් ලංකාවට ආවේනික අතර ඉන් විශේෂ 18 ක් කඳුකර ප්‍රදේශයට පමණක් සීමාවී ඇති ශාකය. පසුව 1992 අධ්‍යයනය අනුව ශාක විශේෂ 101 ක් හඳුනාගෙන ඇති අතර ඉන් විශේෂ 49 ක් ලංකාවට ආවේනික වේ. එය 48.5% ක ප්‍රතිශතයකි.

හෝර්ටන් තැන්නේ හමුවන බහුලම ශාක කුලය Lauraceae ලෙස හඳුනාගෙන ඇති අතර, බහුලම ශාකය ලෙස 1988 දී Cinnamoum ovalifolium පෙන්වා දුන්නද 1993 දී Syzygium ශාකය බහුලම ශාකය යැයි හඳුනා ගෙන ඇත. 1988 දී එස්. රත්නායක මහතාගේ අධ්‍යයනය අනුව තැන්නේ වෘක්ෂ ලතාවන්ගේ ඝනත්වය (Mean Density) හෙක්ටයාර් එකකට ශාක 2861 ක් වේ. තැන්න ආශ්‍රිතව ඇති සෙමින් ගලායන දිය පහරවල් ආශ්‍රිතව ජලජ පැලෑටි වශයෙන් Utricularia Spp (නිල් මොනරැස්ස), Aponogeten (කෙකටියා), Joslenis fluitans ආදිය දැකගත හැකි අතර මේවා ආශ්‍රිතව (විශේෂයෙන් බෙලිහුල්ඔය පෝෂක දිය පහරවල් ලංකාවේ ඇති එකම මිරිදිය රතු ඇල්ගාව වන Batracos Permach පැලෑටියද මද වශයෙන් දැකගත හැකිය.

දිය පහරවල් දෙපස Arundinallia densifolia (කුරු උණ) දැකගත හැකිය. දිය සීරාව ඇති තැන්හි Exacum macranthum (බිනර) Ericanlon spp හා Eennstacdtia scabra ශාක වැඩී ඇත. තෘණ භූමි හා වනාන්තර මායිම් ආශ්‍රිතව Rhododendron arboreum (මාරත්මල්) ශාකය දැකගත හැකි අතර, එම ශාකය හෝර්ටන් ඇතුළු කඳුකර වනාන්තර කිහිපයකට පමණක් සීමා වී ඇති ආවේනිකයෙකි.

තෘණ භූමිවල පොදු තෘණ ලෙස Vulpia bromoides, Veronica serpyuifolia ආදිය වැදගත්වේ.

අඳුරු ආලෝකය හා ඉහළ මීදුම නිසා Usneabarbata (මහළු මිනිසාගේ රැවුළ) වැනි උපජීවී ලයිකන (epiphytic lichens) වර්ග ද Cangiogramme serra, Crupsinus montands වැනි බ්‍රයෝෆිටා ශාක, මීවන වර්ග වැදගත්වේ.

තැන්න ආශ්‍රිතව උඩවැඩියා (Orchide) විශේෂ 33 ක් වාර්තා වන අතර ඉන් විශේෂ 16 ක් ලංකාවට ආවේනිකය. උඩවැඩියා අතුරින් Bulbophyllum විශේෂ හා Eria විශේෂ බහුලව හමුවේ.

තැන්නේ නොයිදුල් වනාන්තර ආශ්‍රිතව Syzygium nevolutum (ජම්බු විශේෂ),Cinnamomum ovalifolium (කුරුඳු විශේෂ), Calophyllum wakeri (කීන) වැනි දැවමය ශාක ප්‍රමුඛ වේ. නොයිදුල් වනයේ දැකිය හැකි ප්‍රධාන ශාක ලෙස Elaeocarpus montana (වෙරළු විශේෂ), Syzygium zeylancus (ජම්බු විශේෂ), Elacocarpus grandulifer (වෙරළු විශේෂ) පෙන්වා දිය හැකිය.

හෝර්ටන් තැන්නේ හමුවන ශාක කුරු ස්වභාවයක් (Pugmy forest) ගන්නා අතර ශාකයන් බොහෝමයක් මීටර 12-15 ත් අතර උසකින් යුක්ත වේ. මෙහි අදික සුළඟට ඔරොත්තු දීම සඳහා ගස් කුරු ස්වභාවයක් ගන්නා අතර වියන කුඩයක හැඩය (Umbrella Shaped) ගෙන ඇත. ශාක පත්‍ර කුඩාවන අතර ඝණ කියුටිනීමය උච්චර්මයක් පවතී.

තැන්නේ ඇති වනාන්තර කොටස් තුළ ඉහළ ශාක සංයුතියක සංකලනයක් දැකගත හැකිය. විශාල ගස් හැරුණු විට පාසි වර්ග (Moss) වල සිට බට පඳුරු දක්වා කුඩා ශාක විවිධත්වයක් ඇති අතර වෘක්ෂ මත ද අපි ශාක බහුල ව දැක බලා ගත හැකිය.

## හෝර්ටන් තැන්නේ සනත්ව සන්තතිය.

තැන්න ආශ්‍රිතව ඇති දේශගුණික තත්ත්වයත්, සුවිශේෂ ශාක ප්‍රජාවත්, කඳු, මොහොර, සානු ආදී භූරූපීය ලක්ෂණ ද හේතු කොට ගෙන මේ ආශ්‍රිත ව සත්ත්ව විවිධත්වයද ඉහළ අගයක් ගනී.

තැන්න ආශ්‍රිතව සිදුකළ අධ්‍යයන අනුව මෙහි සමනළ විශේෂ 40 ක් පමණ වාර්තා වේ. මේ අතර Blue Mormon (Papilio polymnestor), Red Helon (Papilio helenus), Large Birdwiny (Troides helena), Clipper (Parthenos sylvia), Ceylon Forester (Lethe dynsate), Aberrant Bush Blue (Arhopala abseus), Ceylon Tiger (Danais funata) ආදී විශේෂ ද ඇතුළු ව ආවේණික විශේෂ 10-15 අතර වාර්තා වේ. ආවේනිකයන් නොවුනද Common Bluebottle (Zetides sarpedon), Common Banded Peacock (Papilio crino), Yellow Orange Tip (Ixias pyrene), Common Jezebel (Delias eucharis), Panted Lady (Vanessa cardni), Crimson Rose (Polydorus hector)ආදී විශේෂ තැන්නට ලබාදෙන සුන්දරත්වය ඉතා ඉහළය.

මෙම ප්‍රදේශයේ ඇති මල් පිපෙන ශාක (Fowering Plant) විවිධත්වය ද සමනළුන්ගේ වැඩි ගහන ඝනත්වයට හා විශේෂ විවිධත්වයට ඍජුවම බලපාන බව නිරීක්ෂණ වලින් පෙන්වා දිය හැකිය.

හෝර්ටන් ආශ්‍රිතව ප්‍රධානව 1882 දී හඳුන්වාදී ඇති Raonbow Trout (Oncorhynchus mikiss) නම් විදේශීය මත්ස්‍යයා හා අහම්බෙන් ජල මාර්ගවලට නිදහස් වී ඇත. Gloden carp (Cyprinus carpio)මත්ස්‍යයාද ඉතාමත් සුළු වශයෙන් වාර්තාවේ. (මෙම Rainbow Trout මත්ස්‍යයා ලංකාවට ගෙන්වා ඇත්තේ උඩු පුස්සැල්ලාව ශාන්ත ජෝන් වතුයායේ හියු හල්බාඩ් විසිනි). තවද මිරිදිය මත්ස්‍ය ප්‍රජාවට ඇතුලත්වන කකුළුවන් විශේෂ 03 ක්ද මෙහි වාර්තා වන අතර, Trout මසුන් හඳුන්වා දීමට ප්‍රථම හොඳ ව්‍යාප්තියක් පැවතියද අද ඉතාම සුළු වශයෙන් මෙහි වාර්තාවන ලංකාවට ආවේනික Cardina sinhalensis නම් මිරිදිය ඉස්සන් විශේෂ ද වේ.

තැන්න ආශ්‍රිතව හමුවන උභය ජීවී විශේෂ ලෙස Polypendates eques, Philautus vatiabilis, Rhacophrus microtympar.um, Ramanella Palmata, Theloderma schmarda ආදීන් පෙන්වා දිය හැකි අතර මෙහි ආසන්න වශයෙන් උභය ජීවී විශේෂ 16-20 අතර හමුවේ.

හෝර්ටන් තැන්නේ ඇති දේශගුණික තත්ත්වය හේතු කොටගෙන මෙහි උරගයන් ගේ විවිධත්වය ඉතාම අඩු මට්ටමක පවතී. පොළව තුළ ගුල් හාරාගෙන ජීවත්වන ලේ මැඩිල්ලන් (Aspidura copei) හා Aspidura trachyprocta බහුලව වාර්තාවේ. එහෙත් අධික ශීතල හේතුවෙන් කුඩා සතුන් විශාල වශයෙන් මියයාම නිරීක්ෂණය කළ හැකිය.

මෙහි කටුස්සන් (Agamidae) විශේෂ 04 ක් වාර්තා වේ. කඟමුව ඇඟ කටුස්සා (Ceratophara stoddartii), කුරු බෝදිලියා (Cophptis ceylanica), කටකළු කටුස්සා (Calotes nigrilabris), හා එක් වරක් පමණක් කිරිගල්පොත්ත ප්‍රදේශයෙන් වාර්තා වී ඇති පිනුම් කටුස්සා (Otocyptis wiegmanni) ද වේ.

මීට අමතරව කලාතුරකින් ගෘහාශ්‍රිතව ගැරඩියා ද (Ptyasmucosus) වාර්තාවේ.

හෝර්ටන් තැන්න ආශ්‍රිතව වාර්තාවන පක්ෂි විශේෂ සංඛ්‍යාව පිළිබඳව නිශ්චිත නිගමනයකට පැමිණිය නොහැකි අතර මෙම සංඛ්‍යාව පහත පරිදි විවිධ වේ. තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමයට අනුව (1994) පක්ෂි විශේෂ 74 කි. මධ්‍යම පරිසර අධිකාරිය (1994) විශේෂ 85 ක් වශයෙන්ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (1997) විශේෂ 57 ක් වශයෙන් තම ආයතන ප්‍රකාශනයන්හි සඳහන් කර ඇත.

මාගේ පෞද්ගලික අධ්‍යයන දත්ත වලට අනුව හෝර්ටන් තැන්නේ පක්ෂි විශේෂ 98 ක් (1993-1998) වාර්තා වන අතර ඉන් විශේෂ 21 ක් ලංකාවට ආවේනික වේ.

මෙහි වාර්තා වන ආවේනික පක්ෂි විශේෂ කිහිපයක් නම් කඳුකර හම්බු කුරුල්ලා (Bradypterus palliseri), කඳුකර මල් කුරුල්ලා (Zosterops ceylonensis), කඳුකර වී කුරුල්ලා (Lonchurakelarti), රතු දෙමලිච්චා (Turdoides rufescens), කෝපි කුරුල්ලා (Eymyias sordida), වලි කුකුළා (Gallus lafayetii), හබන් කුකුළා (Galloperdix bicalcarata), හූරු කොණ්ඩයා (Pycnontus penicillatus) ආදීන්ද ලංකාවේ හෝර්ටන් තැන්න ඇතුළු කඳුකර වනාන්තර කිහිපයකට පමණක් සීමාවී ඇති තදින්ම වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති ලංකා අරංගයා (Myiophoneus blighi) ද මෙහි හොඳින් වාර්තාවේ.

හෝර්ටන් තැන්නේ පක්ෂි අධ්‍යයනයේදී පක්ෂි සමූහයෝජන රටාව (Bird Flock Feeding) සඳහා විශේෂ ස්ථානයක් හිමිවේ. ආහාර සොයා ගැනීමේ පහසුව හා ආරක්ෂාව සඳහා මෙසේ පක්ෂීන්ගේ සමූහවීමක් සිදුවේ යැයි අනුමාන කළ හැකි අතර, හෝර්ටන්හි අධ්‍යයන අනුව සමූහනය සඳහා පක්ෂි විශේෂ 10ක් පමණ සහභාගීත්වයක් නිරීක්ෂණය කළ හැකිය.

හෝර්ටන් තැන්න ආශ්‍රිතව ක්ෂීරපායී විශේෂ 14 ක් වාර්තා වේ. 19 වන සියවස මුල් භාගයේදී මෙහි අලි ඇතුන් ද වාසය කර ඇති බවට සාධක ලැබී ඇත. වර්තමානයේ මෙහි සිටින සුලබම ක්ෂීරපායී සත්ත්වයා ලෙස ගෝනා (Cervus unicolor) පෙන්වා දිය හැකිය. සවස් කාලයේ විවෘත තෘණ භූමි ආශ්‍රිතව 15 සිට

60 පමණ දක්වා වු රංචු දැක ගත හැකිය. (1996 ඔක්තෝබර්) එමෙන්ම දැනට තැන්න ආශ්‍රිතව ගොනුන් 1500 පමණ වෙතැයි ගණන් බලා ඇත.

තවද මේ ආශ්‍රිතව ලංකාවට ආවේනික උප විශේෂයක් වන ලංකා කොටියා (Panthera pardus kotiya) ද හොඳින් වාර්තාවේ. ආසන්න වශයෙන් කොටින් 15-20 පමණ මෙහි ජීවත්වේ යැයි අනුමාන කළ හැකිය.

මීට අමතරව අඳුන් දිවියා (Felis vivorina), දිය බල්ලා (Lutra lutra), ඉත්තෑවා(Hystriz indica), වල් ඌරා(Sus scrofa), ඕලු මුවා (Muntiacus muntijak) මීමින්නා (Moschiola miminna), හාවා(Lepus nigricollis), දඬු ලේනා... උනහපුළුවා (Ratufa macroura), උනහපුළුවා(Loris tardigradus) ආදීන් වාර්තාවේ. මෙහි සිටින ලංකාවට ආවේනික විශේෂ කිහිපයක් ලෙස රන් හෝතබුවා (Paradoxurus zeylonensis), රිළවා (Macaca sinica) හා Srilankamys ohiyensis නම් මීයන් විශේෂයද, ආවේනික උප විශේෂයක් වන වලස් වඳුරන් (Presbytis senex monticola) ආදීන් පෙන්වා දිය හැකිය.

ඉහත දී විස්තර කෙරුණේ හෝර්ටන් තැන්න ආශ්‍රිත පාරිසරික හා ජෛවීය වැදගත්කම පිළිබඳවය. එහෙත් තැන්නට හානිකර, එහි පැවැත්මට හිතකර නොවන දෑද මේ ආශ්‍රිතව සිදු නොවේ යැයි මෙයින් අදහස් නොවේ. ඒ මන්ද යත් මේ ආශ්‍රිත ව ඕනෑවටත් වඩා පාරිසරික හානි කර ක්‍රියා සිදුවේ. ඒවා කරුණු වශයෙන් සලකා බැලුවහොත්,

* හෝර්ටන් තැන්න ආශ්‍රිතව ස්වභාවික ශාක මිය යාම (Forest die back) තැන්නේ වනාන්තර වල පැවැත්මට හානිකර ස්වභාවික ක්‍රියාවකි. මෙයට හේතු වශයෙන් දිලීරක (Fungi) ආසාදන ක්‍රියාවලියක් පිළිබඳ සැක මතුවී ඇති අතර පසේ පොඩ්සොලීකරණය, පරිසර දූෂණය, පසේ ඇති පිට් ආදිය ද මෙයට බලපෑ හැකි බවට සැක මතු කළ හැකිය.

* තැන්න ආශ්‍රිතව අනවසර මැණික් ගැරීමද, ප්‍රධාන ව බෙලිහුල්ඔය මුල් කර ගෙන සිදු කරයි. මෙය ඒ ආශ්‍රිත ශාක ප්‍රජාවට තර්ජනයක් ලෙස පෙනී යයි.

* හෝර්ටන් තැන්න ආශ්‍රිතව මහා පරිමාණ ගස් කැපීමේ ජාවාරම් නොවුනද, වනාන්තර මායිම් ප්‍රදේශවල යම් තරමකට ශාක විනාශය සිදු වෙතැයි තොරතුරු ඇත. මෙම ක්‍රියාවන් බහුතරයක් පෞද්ගලික දැව අවශ්‍යතාව සඳහා ඒ ආශ්‍රිතව ජීවත් වන්නන් කරන ක්‍රියාවන්ය.

* තැන්න ආශ්‍රිතව සත්ව දඩයම පිළිබඳව සාපේක්ෂව යහපත් තත්ත්වයක් ඇත. එහෙත් වනාන්තර මායිම් ගම්මාන ආශ්‍රිතව වල් ඌරන් දඩයම සිදුවන බව සොයා බැලූ තොරතුරු අනුව පෙන්වා දිය හැකිය.

* තැන්න ආශ්‍රිතව ඇතිවන ගිනිගැනීම් සැලකූ කල මෙහි පැවැත්මට වඩාත්ම හානිකර ක්‍රියාවක් ලෙස පෙන්වා දිය හැකිය. සාමාන්‍ය ස්වභාවික තත්ත්ව යටතේදී තෘණ භූමි ආශ්‍රිතව හා වනාන්තර ආශ්‍රිතව ගිනි ගැනීම් ඇති වුවද මෑතක සිට මෙය නැරඹීමට පැමිණෙන, විශේෂයෙන් දේශීය සංචාරකයන් විසින් සිතාමතාම ගිනි ඇතිකිරීම අභාග්‍යයකි. මේවාට උදාහරණ ලෙස තැන්නේ ප්‍රදේශයේ 1980 මාර්තු මැද භාගයේදී මහා ගින්නක් ඇති වී ඇති අතර, මෙය දින 10-15 පැවතී ඇත. අද ද එයින් විනාශවී ඇති ශාකවල කොටස් දැකගත හැකිය. මෑත යුගයේ මහත් ආන්දෝලනයකට ලක්වූ ගින්න ලෙස ඔහිය කෙටි මාර්ගය ප්‍රදේශයේ ඇති කල ගින්න පෙන්වා දිය හැකිය. 1998 පෙබරවාරි මාසයේදී ඇතිවූ එම ගින්නෙන් විනාශ වූ භූමි ප්‍රමාණය අක්කර 300-500 අතර වනවා සේම විශාල ශාක, සත්ව ජීවිත ප්‍රමාණයක්ද ඒ සමගම විනාශ විය. මෙම ගින්න ඇති කිරීමට ගුරුතලාවේ සිට පැමිණි හත් දෙනෙකුගෙන් යුත් මුස්ලිම් තරුණයන් පිරිසක් මුල්වී ඇත. 1998 පෙබරවාරි 07 වැනිදා ද ඔහිය ප්‍රධාන මාර්ගයේ ගින්නක් ඇතිවී ඇති අතර එයින් අක්කර 2-3 අතර වන ප්‍රදේශයක් විනාශ වී ගොස් ඇත. එයද මුස්ලිම් තරුණයන් තිදෙනෙකුගේ නොමනා ක්‍රියාවක ප්‍රතිඵලයක් විය.

කෙසේ නමුත් මේ ක්‍රියාවන්ට ලබාදිය හැකි දඩුවම් ඇතත් ඒවායේ ශක්තිමත් භාවය පිළිබඳ ප්‍රශ්ණ මතුවේ. 1993 අංක 47 දරන සංශෝධිත වන ජීවී පනත අනුව මෙවැනි ක්‍රියාවක් කළ අයෙකුට අවුරුදු 1-5 අතර සිර දඬුවමකට යටත්වීමට සිදුවේ. එහෙත් ලබා දිය හැකි සිර දඬුවම අත්හිටවිය හැකි එකක් වීමද, බොහෝ විට රු.1000 ක් පමණ දඩයකට යටත් කර වැරදිකරුවන් නිදහස් කිරීම ද සාමාන්‍ය සිරිතය. මෑතක් වන තුරුම හෝර්ටන් තැන්නේ ගිනි ගැනීම වැලැක්වීමට ගිනිපටි (Fire Belt) පැවතියද වර්තමානයේ එම ක්‍රමයත් අභාවයට ගොස් ඇති සෙයකි.

* මේ ආශ්‍රිතව ඇති තවත් ප්‍රධාන අභාග්‍ය නම් තැන්න නැරඹීමට පැමිණෙන්නන් විසිතුරු පැලෑටි වශයෙන් මෙහි ඇති වටිනා දුලභ ශාක විශේෂ ගලවාගෙන යාමය. සති අන්ත දිනයන්හිදී දහස් ගණනින් සෙනග මේ කරා පැමිණෙන අතර ඔවුන්ගේ බහුතරය බිනර, මාරත්මල් ඇතුළු ගස් වර්ග රැගෙනයාම සිදු කරනු නිරීක්ෂණය කළ හැකිය.

මෙම පිරිස් බොහෝමයකගේ ඒකායන අරමුණ ලෝකාන්තය නැරඹීම පමණි. ඔවුනට හෝර්ටන් තැන්නේ පාරිසරික, ජෛවීය වැදගත්කම පිළිබඳව කිසිදු අවබෝධයක් නැති අතර වනෝද්‍යානය තුල ක්‍රියාත්මක නීති පිළිබඳව අවබෝධයක් නොමැති බව ඔවුන් බොහොමයක් සමග සිදුකළ අහඹු සාකච්ඡා මගින් අනාවරණය කරගත හැකි විය.

පට්ටිපොළ හා ඔහිය මාර්ග දෙකෙන් විශාල වශයෙන් සංචාරක පිරිස් වාහන මගින් තැන්නට ඇතුළුවෙති. දිනකට පැමිණෙන අධික වාහන ප්‍රමාණය නිසා සිදුවන ශබ්ද හා වායු දූෂණයට අමතරව අධික වේගයෙන් ගමන් කරන වාහන නිසා සත්ත්ව

විශේෂ වාහන වලට හසුවී මිය ගොස් ඇති අවස්ථා සුලභව දැකගත හැකිය. වාහන වලින් පිටවන අධික දුම හේතුවෙන් නුදුරු අනාගතයේදීම ලයිකන, පාසි ශාක හා අනෙක් ජීවීන්ට තර්ජනය ඇති විය හැකිය.

තැන්න නරඹන්නට එන බොහෝ තරුණ පිරිස් රහසේ මත්පැන් රැගෙන එන අතර මත්පැන් බීමෙන් පසු ඔවුන් ක්‍රියා කරන ආකාරය වනෝද්‍යානයේ නීතිරීති වලට බෙහෙවින් පටහැනි වේ. එපමණක් නොව හිස් මත්පැන් බෝතල් තැන්නේ ඇති දිය පහරවල් වල බිඳ දමයි. ඒවාට බසින බොහෝ දෙනෙකුගේ පාද කැපී දරුණු තුවාල මේනිසා ඇතිවූ අවස්ථා වාර්තාවී ඇත. පොලිතින් එකතුවීම හෝර්ටන් තැන්නට ඇති ප්‍රබල තර්ජන වලින් ප්‍රධාන තැනක් ගනී. සංචාරක පිරිස් අක්‍රමවත්ව මෙහි පොලිතින් ද්‍රව්‍ය දැමීමෙන් මෙහි පරිසරයේ සුන්දරත්වයට හා ශාක හා සතුන්ගේ පැවැත්මට තර්ජනයක්වී ඇත. සමහර අවස්ථාවන්හිදී ගෝනුන් විසින් පහරන මළ ද්‍රව්‍ය සමග පොලිතින් තිබූ අවස්ථාවන් දැක ගන්නට ලැබී ඇත. පොලිතින් ඇතුළුව පොදුවේ කැළිකසළ ප්‍රශ්නය මෙහි සුන්දරත්වයට හා ස්වභාවික පැවැත්මට මහත් තර්ජනයකි.

ඇතැම් ජන මාධ්‍යයන් විසින් හෝර්ටන් තැන්නේ සුන්දරත්වය පමණක් අතිශෝක්තියෙන් හුවා දැක්වීම හේතුකොට ගෙන විශාල පිරිසක් එම සුන්දරත්වය විඳීමට හා එය නැරඹීමට තැන්න කරා පැමිණී අතර ඔවුන් රැගෙන එන ද්‍රව්‍ය වල ඉතිරිය අපද්‍රව්‍ය ලෙසින් තැන්නේ ගොඩ ගැසිණී. මෙම අපද්‍රව්‍ය ගොඩගැසීමත් සමග කපුටන්ගේ (Corvus splendernus) ආගමනය සිදුවූ අතර, අද තැන්නේ නිවහන කරගෙන ජීවත්වන කටුස්සන්, පක්ෂීන් ආදී සතුන්ට මෙමගින් මහත් තර්ජනයක් එල්ල වී ඇත.

හෝර්ටන් තැන්නේ ඇති දේශීය ශාකවලට හානිකරමින් වැඩෙන එක් විදේශීය ශාකයකි රනිල කුලයට (Legumenosae) අයත් Eulex uropiea මෙය ඉංගිරිසීන් විසින් අලංකාරය සඳහා සිටුවීමට යුරෝපයේ සිට රැගෙන එන ලද්දකි. වර්තමානයේ තැන්නපුරා විශාල ව්‍යාප්තියක් දරන මෙම ශාකය සීග්‍රයෙන් බීජ හටගනිමින් ප්‍රරෝහනය වී ව්‍යාප්ත වන අතර අනෙක් දේශීය ශාකවල පැවැත්මට විශාල තර්ජනයක් එල්ල කරයි. දැනට කිසිම සතකු විසින් ආහාරයට නොගැනීම ද මෙහි පැවැත්මට විශාල පිටුවහලක් වී ඇත.

හෝර්ටන් තැන්නේ බැලූ බැල්මට නොපෙනෙන එහෙත් ජෛව උරුමයන්ගේ ආරක්ෂාව සහ අයිතිය කෙරෙහි ඍජුවම බලපාන ගැටළු සහගත තත්ත්වයක්ද ඇත. එනම් විදේශිකයන් (දේශීය අය මෙය නොකරනවා යැයි හෝ මේවාට උදව් නොකරනවා යයි මෙයින් අදහස් නොවේ.) හොර රහසේම වටිනා ආවේනික පැළෑටි, ශාක නිදර්ශක, ජන තම රටවලට රැගෙන යාම, එසේ නැතිනම් ජාන මංකොල්ලයයි. මෙම කොල්ලකෑම හමුවේ අපේ රටට අයිතිය අහිමිවූ එහෙත් අපට ආවේනික ශාකයක් වන නිල් බිනර (Exacumtrnerviam) නිදර්ශනයක් වශයෙන් පෙන්වා දිය හැකිය. කෙසේ නමුදු හෝර්ටන් තැන්නේ සෞන්දර්යය, ජෛවීය, දේශගුණික සමාජ ආර්ථික වටිනාකමට නොදෙවෙනි මට්ටමෙන් ඒ ආශ්‍රිත ව එහි පැවැත්මට හානිකර තත්ත්වයන් ගැටලු සහගත තත්වයන් ඇතැයි යන්න මනාව පැහැදිලි වනු ඇත. දිනෙන් දින ජනප්‍රිය වෙමින් ඉදිරියට යන වනජීවී පාරිසරික සංචාරක රැල්ල හමුවේ සාපේක්ෂව වඩාත් වැඩියෙන්ම හානිකර අන්දමින් ගොදුරු වී ඇති භූමිය ලෙස හෝර්ටන් තැන්න පෙන්වා දුනහොත් එහි ඇති වරදක් නැතැයි සිත්වේ.

ලෝකයේ හෝර්ටන් තැන්න වැනි අසාමාන්‍ය පරිසර පද්ධති ඇත්තේ අතළොස්සක්. මෙහි ඇති බහුවිධ වැදගත්කම් සලකා අනාගතයේ ලෝක උරුමයක් (World Heritage) කිරීමට තරම් හේතු සාධක ඇත.

වර්තමානයේ ඇති මානව ආචරන (Humen effets) තත්ත්වයන් හා ආක්‍රමනිකතාවන් හමුවේ හෝර්ටන් තැන්නේ අනාගත පැවැත්ම පිළිබඳව සතුටුදායක සිතුවිල්ලක් ඉපිදවිය නොහැකිය.

මෙවැනි වටිනා ආරක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහා අනපනතක් නීති රෙගුලාසිද බොහෝය. නීති තිබුණත් ඒවායේ ක්‍රියාත්මක භාවය පිළිබඳව ද ගැටළු මතුවේ. මෙවැනි ස්ථාන ආරක්ෂාව සඳහා නීති රෙගුලාසි මතම පිහිටා කටයුතු කළ නොහැකි බව සැබෑ තත්ත්වය හා අතීත හා වර්තමාන අත්දැකීම් වේ. වනෝද්‍යාන ආශ්‍රිතව ජීවත්වන්නන් මෙන්ම පිටස්තරින් මෙය නරඹන්නට පැමිණෙන සංචාරකයන් හට (විශේෂයෙන් දේශීය සංචාරකයන්ට) තැන්න පිළිබඳව වඩාත් යහපත් ආකල්පයක් ඇති කරවිය හැකි ආකාරයෙන් ක්‍රියාත්මක වැඩ පිළිවෙළක අවශ්‍යතාව මෙහිදී පැහැදිලිවම මතුවේ.

කෙසේ නමුදු හෝර්ටන් තැන්නේ අනාගතය යහපත් කළ යුතුය. ඒ මන්ද යත් ඒ වටිනා අසාමාන්‍යය පරිසර පද්ධතිය විනාශ වී ගිය හොත් සමහර විට අනාගතයේදී අප රටට හිමිවීමට ඇති මුළු මහත් ලෝකයට ම වැදගත් වන ස්වභාවික ලෝක උරුමයක අවසානයද, හෝර්ටන් තැන්නේ විනාශයත් සමගම සිදුවීමට බොහෝවිට ඉඩ ඇති නිසාය. එහෙයින් මෙම අසාමාන්‍ය පරිසර පද්ධතිය රැකගැනීම මුළු මහත් ජාතියේම වගකීමක් කොට සලකා සිදු කළ යුතු වැදගත් කටයුත්තකි.

**ශ්‍රී ලාල් නිශාන්ත හෙට්ටිආරච්චි**
**හිටපු වැඩසටහන් නිලධාරී**

*සටහන: වනජීවී භාරයේ සේවය කරමින් සිට හදිසි අනතුරකින් වියෝවූ ශ්‍රී ලාල් මහතා මිය යාමට පෙර අප වෙත ලබාදුන් ලිපියකි.*